# ශාසන චිරස්ථිතිය විෂයෙහි භික්ෂුණී සමාජයේ බලපෑම

ආචාර්ය එච්. ආර්. නිශාදිනී පීරිස්[1]

## හැඳින්වීම

භික්ෂුණී සමාජය පිහිටුවීම ශාසන චිරස්ථිතිය විෂයෙහි සෘජු බලපෑමක් සිදුකළ බවට මතයක් පවතී. එයට පාදක වී ඇත්තේ භික්ෂුණී සමාජය පිහිටුවීම පිළිබඳව සඳහන් ත්‍රිපිටක තොරතුරුය. නමුත් මෙම මතය ත්‍රිපිටකයේම සඳහන් සෙසු තොරතුරුවලට පරස්පරය. එමනිසා ශාසන චිරස්ථිතිය විෂයෙහි භික්ෂුණී සමාජයේ බලපෑම පිළිබඳව විචාරාත්මක අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයෙහි අරමුණයි.

## ක්‍රමවේදය

මූලාශ්‍ර අධ්‍යයනය මෙම පර්යේෂණය සඳහා යොදාගෙන ඇති ක්‍රමවේදය වන අතර ත්‍රිපිටකය හා අට්ඨකථා මෙහි මූලාශ්‍ර වශයෙන් භාවිත කෙරිණි.

## සාකච්ඡාව

ත්‍රිපිටකය තුළ භික්ෂුණී සමාජයෙහි ආරම්භය පිළිබඳ තොරතුරු ඇතුළත් ස්ථාන දෙකක් ඇත. ඉන් එකක් වනුයේ චුල්ලවග්ගපාළි භික්ඛුණී ඛන්ධකයයි. අනෙක අංගුත්තර නිකායෙහි අට්ඨක නිපාතයයි. මෙලෙස විනය පිටකයෙහි හා සූත්‍ර පිටකයෙහි භික්ෂුණී සමාජයෙහි ආරම්භය පිළිබඳ විස්තර ඇතුළත් වුවද එහි සුවිශේෂී බවක්ද දැකිය හැකිය. එනම් මෙම පිටක දෙකෙහිම අඩංගු ඒ පිළිබඳ තොරතුරු මුළුමනින් ම එක හා සමාන වීමයි (චු.ව.පාලි II, පි.468-79, අ.නි. V ගොතමී සංයුක්තය- 220-31). මෙම ත්‍රිපිටක තොරතුරුවලට අනුව මාගම පැවිද්ද අනු දක්නා ලෙස බුදුරජාණන්වහන්සේගෙන් මුලින්ම ඉල්ලා සිටින්නේ මහා ප්‍රජාපතී ගොතමිය විසිනි. එය තෙවරක් දක්වාම ප්‍රතික්ෂේප විය. බුදුසසුන තුළ කාන්තා පැවිද්දට බුදුරදුන්ගෙන් අනුබල නොලැබීම භාරගෙන නික්මගිය ප්‍රජාපතී ගෝතමිය, තම අධිෂ්ඨානය සාක්ෂාත් කරගැනීම සඳහා වෙනත් ආකාරයකින් ක්‍රියාත්මක වූවාය. එනම් එතුමිය පන්සියයක් ශාක්‍ය ස්ත්‍රීන් ද සමගින්, කෙස් සිඳුවා, කසාවත් හැඳ, පා ගමනින් ම බුදුරදුන් මුණගැසීමට විශාලා මහා නුවර, මහා වනයෙහි, කූටාගාර ශාලාව වෙත පැමිණ, බුදුරදුන් මුණගැසීමට නොගොස් බිහිදොර කොටුවෙහි රැඳී සිටියාය. මෙම පිරිස විෂයෙහි අනුකම්පාවෙන් මාගම පැවිද්ද ඇයදිමට ඉදිරිපත් වූයේ ආනන්ද හිමියන් විසිනි. එම ඉල්ලීම ද ප්‍රථමයෙන්

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රාජ්‍ය කළමණාකරණ අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, nishadinip@gmail.com

ප්‍රතික්ෂේප විය. මේනිසා අන් ක්‍රමයකින් අවසර ලබාගැනීමට එහිමියෝ උත්සාහ කළහ. එනම් කාන්තාවට ගිහිගෙය හැරදමා පැමිණ තථාගත ශාසනයෙහි පැවිදිව, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, හෝ රහත් පල ලැබිය නොහැකිද? යන පැනය නැගීමයි. මෙම පැනයට පිළිතුරු දෙන බුදුරජාණන්වහන්සේ කාන්තාවට එය හැකිබව ප්‍රකාශ කළහ. එසේ නම් හදාවඩා පෝෂණය කළ ප්‍රජාපතී ගෝතමිය හට කෘතගුණ සැලකීමක් ලෙස හෝ, කාන්තා පැවිද්ද ලබාදීම සුදුසු බවට ආනන්ද හිමියන් කළ ප්‍රකාශයට ප්‍රතිචාරයක් ලෙස, බුදුරජාණන්වහන්සේ විසින් කාන්තා පැවිද්ද අනුදැන වදාළහ. එහිදී බුදුරජාණන්වහන්සේ, ගරු ධර්ම අටක් පනවා, එය පිළිගන්නේ නම්, මහා ප්‍රජාපතී ගෝතමියට උපසම්පදාව සිදුවන බව ප්‍රකාශ කළහ. මෙම සැම ගරු ධර්මයක්ම අවසන එය "සත්කාරකොට, ගරුකොට, බුහුමන්කොට, පුදා, දිවිහිමියෙන් නොඉක්මවිය යුක්තක්" (චු.ව.පාලි II, පි.472-75, අ.නි. V ගොතමී සංයුක්තය- 226-29)ලෙස අවධාරණය කර ඇත. බුදුරදුන්ගෙන් මෙම අෂ්ට ගරු ධර්මයන් උගත් ආනන්ද තෙරණුවෝ, එය ප්‍රජාපතී ගෝතමියට ඉදිරිපත් කළහ. මහා ප්‍රජාපතී ගෝතමියද "යම් සේ ස්ත්‍රියක හෝ, පුරුෂයෙකු හෝ, බාලයෙකු හෝ, තරුණයෙකු හෝ, හිස සෝදා, උපුල් මල් දමක්, දෑසමන් මල් දමක්, හෝ යොහොඹු මල් දමක් ලැබ, දෑතින් පිළිගෙන, උත්තමාංගය වූ හිස මුදුනෙහි පිහිටුවා ගන්නා ලෙසත්, එම අෂ්ට ගරු ධර්මයන් පිළිගන්නා බවත්" (චු.ව.පාලි II, පි.474-75) ප්‍රකාශ කළාය. මහා ප්‍රජාපතී ගෝතමිය විසින් අෂ්ට ගරු ධර්මයන් පිළිගැනීමෙන් උපසපන් වූ බව, ආනන්ද හිමියෝ බුදුරදුන්ට දැනුම් දුන්හ. තමන්වහන්සේ විසින් මාගම පැවිද්ද අධෛර්යමත් කිරීමට හා, අෂ්ට ගරු ධර්මයන් පැනවීමට, හේතුවූයේ කුමක්ද? යන්න, පිළිබඳව එහිදී බුදුරදහු ආනන්ද හිමියන්ට පැහැදිලි කළහ (එම පි.476-78). එයට අනුව භික්ෂුණී සමාජය පිහිටුවීම සිදු නොවුනේ නම් මාර්ග බ්‍රහ්මචර්යාව චිරස්ථිතික වෙයි. වසර දහසක් ප්‍රතිවේධ සද්ධර්මය පවතී. එහෙත් භික්ෂුණී සමාජය පිහිටුවීම නිසා ප්‍රතිවේද සද්ධර්මය පවතින්නේ වසර පන්සියයක් පමණි. උපමා තුනක් මගින් එය පැහැදිලි කරන බුදුන්වහන්සේ, කවර ශාසනයක ධර්ම විනයක් අනුව මාගම ගිහිගෙයින් නික්ම අනගාරික වූ ශාසනයෙහි පැවිදි වුවද, ඒ ශාසනය ඉක්මනින් පරිහාණියට පත්වන බව, පැහැදිලිව ම දැක්වූහ. ඒ අනුව මෙය බුද්ධ ශාසනයට පමණක් නොව, සෙසු ශාසනයන්ට ද පොදු ප්‍රකාශයකි. කාන්තාව ආධ්‍යාත්මික විමුක්තිය අපේක්ෂාවෙන් කුමන ධර්ම විනයක් අනුව පැවිදි වුවද, එය නොකළ යුත්තක්ය යන්න, අවධාරණය කිරීමකි. ශාසන චිරස්ථිතිය විෂයෙහි භික්ෂුණී සමාජය පිහිටුවීම සෘණාත්මක බලපෑමක් කරන බවට වන ආකල්පයෙහි පදනම ත්‍රිපිටකයේ දැක්වෙන ඉහත සඳහන් විස්තරයයි.

එහෙත් සමන්තපාසාදිකා විනය අටුවාවෙහි භික්ඛුණීඛන්ධක වණ්ණනාව පවා මෙම මතය බැහැර කිරීමට යම් උත්සාහයක් ගෙන ඇති බව පෙනේ. එයට

අනුව ඒ දක්වා සෑම බුදුවරයකුටම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, ලෙස සිවුවණක් පිරිසක් සිටි හෙයින් බුදු සසුන තුළ භික්ෂුණී සමාජය පිහිටුවීම අලුත් දෙයක් නොවේ. එසේ වුවත් යමක් දුක්විඳ ලබාගත් විට -දුක්බෙන ලදධා, එහි අගය වැඩි වන හෙයින් භික්ෂුණී සමාජය පිහිටුවීමට ගෞතමිය කළ යෝජනාව ප්‍රතික්ෂේප විය (ස.පා. පි. 286). බුද්ධකාලීන භාරතීය සමාජය තුළ කාන්තාව, ඒ වන විට ලබා සිටි තත්වය අනුව, අටුවාචාර්යවරයා දක්වන මෙම මතය සාධාරණ බව පෙනේ. බ්‍රාහ්මණ හා ශ්‍රමණ සම්ප්‍රදායන්ගේ බුද්ධි සට්ටනය තුළ අතරමංව පැවති කාන්තා විමුක්තිය පිළිබඳ තත්ත්වය අනුව බලන විට, සැබවින්ම එවැනි වටිනාකමක් පිළිබඳ හැඟීමක් ලබාදීමේ අවශ්‍යතාවක් ද පැවතිණි. එයින් අනතුරුව අටුවාව බුදුරදුන් විසින් බුදු සසුනෙහි සාමාන්‍ය සම්ප්‍රදායට පටහැණිව, එනම් කරුණක් නොමැතිව, භික්ෂුණී සමාජය අරම්භයේදීම අෂ්ට ගරු ධර්ම පැණවීමටත් හේතු වූ කරුණු සාකච්ජා කරයි. භික්ෂුණී සමාජයේ ආරම්භයේදීම අෂ්ට ගරු ධර්ම පැණවීම පිළිබඳව ආනන්ද හිමියන්ට කළ පැහැදිලි කිරීමට අනුව "පුරුෂයන් මහා වැවක දිය වැව ඉක්මවා පිටතට ගැලීම වළක්වනු පිණිස, කල් තබාම වේල්ලක් බඳින ලෙසට" බුදුරජාණන්වහන්සේ විසින් කඩ නොකළ යුතු ගරු ධර්ම අටක් භික්ෂුණීන් සඳහා පනවා ඇත. ඉහත ප්‍රකාශය වඩාත් පැහැදිලි කරන අටුවාව විශාල වැවක බැම්මක් බැඳ නොතිබුණද ඉතිරි වන වතුර ප්‍රමාණයක් හා බැම්මක් නැති විට නැති වන වතුර ප්‍රමාණයක් ඇති බව සඳහන් කරයි. වැවට මුලින්ම බැම්මක් බැඳිවිට බැම්මක් නොමැති විට නැතිවන වතුර ප්‍රමාණයද ආරක්ෂාකර ගත හැක. මෙහිදී වේල්ල නොබැන්ද ද ආරක්ෂා වී පවතින වතුර ප්‍රමාණය යනු, භික්ෂුණී විනය ශික්ෂාවන්ය. අෂ්ට ගරු ධර්මයන් පණවා ඇත්තේ, මෙම භික්ෂුණී විනය ශික්ෂාවන් ගෙන් රැකෙන ප්‍රමාණයට වඩා වැඩි ආරක්ෂාවක්, ශාසනයට ලබාදීම සඳහාය (ස.පා. පි. 286). භික්ෂුණී ශාසනයෙහි ආරම්භය පිළිබඳ ත්‍රිපිටක විස්තරයට අනුව, බුදුන්වහන්සේ ම පවසන පරිදි, අෂ්ට ගරු ධර්ම නොපැණවූයේ නම් කාන්තා පැවිද්දෙහි සද්ධර්මය පවතින්නේ වසර පන්සියයකි. එහෙත් අෂ්ට ගරු ධර්ම පැණවූ නිසා මාගම පැවිද්ද චිරාත් කාලයක් පවතී. වසර දහසක් පිළිබඳ සඳහන අදාලවන්නේ සිව් පිළිසිඹියා සහිත භික්ෂුණීන්වහන්සේලා සඳහාය. ඉන්පසු තවත් වසර දහසක් සුක්ඛ විපස්සිකාව හෙවත්, සමථයෙන් තොර විදර්ශනාව වැඩූ භික්ෂුණීන්වහන්සේලා සඳහා අදාළ වේ. අනාගාමී පල සහිත භික්ෂුණීන් සඳහා සහස් වසරක් ද, සකෘදගාමී පල සහිත භික්ෂුණීන් සඳහා සහස් වසරක් ද, සෝවාන් පල සහිත භික්ෂුණීන් සඳහා සහස් වසරක් ද, අදාළ වේ. මෙසේ ප්‍රතිවේධ සද්ධර්මය සහිත ශාසනය වසර පන්දහසක් පවතී. පර්යාප්තිය සහිත ශාසනය තවත් වසර පන්දහසක් පවතී. ඉන් පසුවද ලිංගය හෙවත් ශාසනය බොහෝ කල් පවතී. ආරම්භයේදී ම ගරු ධම්ම අට ද පනවා ඇති හෙයින්, බුදුසසුනෙහි චිරස්ථිතිය විෂයෙහි, භික්ෂුණී සමාජය පිහිටුවීම මගින් බලපෑමක් සිදුවී නැති බව,

අටුවාචාර්යවරයාගේ මතය වූ බව මේ අනුව පැහැදිලි වේ. අටුවාචාර්යවරයා භික්ෂුණී ශාසනයෙහි චිරස්ථිතිය විෂයෙහි වැඩි අවධානයක් දෙමින්, ඒ පිළිබඳව පැහැදිලි කරන ආකාරයක්ද, හඳුනාගත හැකිය. කෙසේ වුවත්, මෙම තොරතුරු අනුව අටුවා ලියවෙන යුගය වන විට පවා, භික්ෂුණී සමාජය විෂයෙහි සුභවාදී ආකල්පයක් පැවති බව පැහැදිලිය. එමෙන්ම මාගම පැවිද්ද ශාසන චිරස්ථිතිය විෂයෙහි සෘණාත්මක බලපෑමක් කරන බවට සඳහන් වන එකම අවස්ථාව ද ඉහත සඳහන් ත්‍රිපිටක විස්තරයම පමණි. සෙසු සියලු තොරතුරු මෙයට පරස්පරය. නිදසුනක් ලෙස, මහාපරිනිබ්බාණ සූත්‍රයට අනුව, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, යන සිව්වණක් පිරිස ශාස්තෘ ශාසනය ඉස්මතු කොට ධර්ම දේශනා කරන තුරු, තමන්වහන්සේ පිරිනිවන් නොපාන බව, බුදුරදුන් විසින් මාරයාට ප්‍රකාශ කර ඇත (දී.නි. II, පි. 162-67). භික්ෂු සමාජය මෙන්ම භික්ෂුණී සමාජය පිහිටුවීම ද, සිදුවිය යුතුම දෙයක් ලෙස බුදුන්වහන්සේ සැලකූ බව, මේ අනුව පැහැදිලි වේ. ථෙරි අපදාන පාලියෙහි අඩංගු පිරිනිවන් පෑමට තීරණය කළ මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පන්සියයක් තෙරණියන් ඒ සඳහා අවසර ගැනීමට බුදුරදුන් වෙත එළඹි අවස්ථාව මෙයට තවත් නිදසුනකි. එහිදී මහා ප්‍රජාපතී ගෝතමිය, ස්ත්‍රීන් සියලු වරද කරනා බව දන්නා හෙයිනුත්, ස්ත්‍රීනට පැවිද්ද පුන පුනා යාඥා කිරීම වරදක් නම් ඒ සඳහාත්, බුදුරදුන්ගේ අනුගාමිකයන් භික්ෂුණීන්ට අනුශාසනා කිරීමේදී වැරදි ලෙස අනුශාසනා කළේ නම් ඒ සඳහාත්, ක්ෂමා කරන ලෙස ඉල්ලා සිටියාය (අපදාන පාලි II-48-49). එයට පිළිතුරු දෙන බුදුන් වහන්සේ "ගුණ හරණ ඇති තැනැත්තිය කමාවට කරුණු නැති තැන්හි ක්ෂමා කළයුතු කුමක් නම් වන්නේද?" යි පවසා මාගමුන්ගේ ධර්මාභිසමයෙහි යම් අඥානයෙක් විමතියට ගියාහු ද, ඔවුන්ගේ දෘෂ්ටි ප්‍රහාරණය පිණිස ඍද්ධි දක්වන ලෙසද ඉල්ලීමක් කළහ. මෙම ඉල්ලීමට අනුව මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියෝ නොයෙක් ඍද්ධි දැක්වූහ. උත්පලවණ්ණා තෙරණියගෙන් ද, යශෝධරා ප්‍රමුඛ දහඅට දහසක් භික්ෂුණීන්ගෙන් ද, මේ ආකාරයෙන්ම ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වන ලෙස බුදුරදහු ඉල්ලා සිටියහ. මේ අනුව කාන්තා පැවිද්ද සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේගේ ආකල්පය ඉහත දැක්වූ ත්‍රිපිටක විස්තරයට පරස්පර බව පැහැදිලිය.

භික්ෂු භික්ෂුණීන් උපසම්පදා කළ හැකි වයස් පිළිබඳව වන පැණවීම් අතර වන වෙනස, කාන්තා පැවිද්ද පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන තවත් නිදසුනකි. මුලදී වයස් සීමාවකින් තොරව උපසම්පදාව ලබාදුන්න ද, පසුව ඒ සඳහා වයස් සීමාවක් පනවා ඇත. එසේ වයස් සීමාවක් පැණවීමට හේතු දක්වන බුදුරජාණන් වහන්සේ, විසි වයසින් අඩු පුද්ගලයා සීත, උෂ්ණ, බඩගිනි, පිපාසා, මැසි, මදුරු, අව්, වැසි, සුළං, යන්නවුන්ගේ පහස නොඉවසන බවත්, නොමනා සේ කියූ නපුරු වචන, සිරුරෙහි හටගත් දුක් වූ, තියුණු වූ, රළු වූ, කටුක අමිහිරි වූ, මන

නොවඩන්නාවූ, පන නසන්නාවූ, වේදනාවන් නොඉවසන බවත්, පවසති. එහෙත් විසිවයස් ඇති පුද්ගලයා සීත, උෂ්ණ, බඩගිනි, පිපාසා, මැසි, මදුරු, අව්, වැසි, සුළං, යන්නවුන්ගේ පහස, නොමනා සේ කියූ නපුරු වචන, සිරුරෙහි හටගත් දුක් වූ, තියුණු වූ, රළු වූ, කටුක අමිහිරි වූ, මන නොවඩන්නාවූ, පන නසන්නාවූ, වේදනාවන් ඉවසීමට සමත්ය. (ම.ව. පාලි I පි. 192-93) උපසම්පදාව ලබාදීම සඳහා විසි වයස් සම්පූර්ණවීම අනිවාර්ය වන්නේ එහෙයිනි. මෙම පැණවුම භික්ෂුව විෂයෙහි පොදුවේ බලපාන්නකි (පාචි. පාලි I පි. 346-51). එහෙත් භික්ෂුණීන් උපසම්පදා කිරීමේ දී, ඇය විවාහක කතක් නම් (ගිහිගතා) දොළොස් වයස සම්පූර්ණව පැවතීම ප්‍රමාණවත්ය ( පාචි. පාලි II පි. 295-307).භික්ෂුණියක උපසම්පදා කිරීමේ දී විසි වයස සම්පූර්ණවීම අනිවාර්ය වන්නේ ඇය කන්‍යාවක (කුමාරි භූතා ) නම් පමණි ( පාචි. පාලි II පි. 314-25). භික්ෂු භික්ෂුණීන් උපසම්පදා කළහැකි වයස් සීමාවන් පිළිබඳව වන පැණවුම්වල ඇති මෙම වෙනස, ස්වභාවයෙන්ම කාන්තාව සතු දරාගැනීමේ හැකියාව කෙරෙහි සැලකිල්ල දක්වා තිබෙන බවට කදිම නිදසුනකි.

පාරාජිකාපාළියට අනුව පෙර බුද්ධවරුන්ගේ ශාසන චිරස්ථිතිය විෂයෙහි බලපෑ සාධක ලෙස, බුදුරජාණන්වහන්සේලා විසින් විස්තර වශයෙන් ධර්මය දේශනා කිරීම හෝ නොකිරීම, නවාංග ශාස්තෘ ශාසනය බොහෝ වී හෝ නොවීම, ශ්‍රාවකයන්ට ශික්ෂාපද පැණවීම හෝ නොවීම, පාමොක් උදෙසීම හෝ නොඋදෙසීම දක්වා ඇත පාරා. පාලි පි. 16-21). එහෙත් භික්ෂුණී සමාජය පිහිටුවීම ඊට හේතු වූ බවක් දක්වා නැත. එසේම ශාසන චිරස්ථිතිය විෂයෙහි බලපාන සාධක ලෙස ත්‍රිපිටකයේ සෙසු ස්ථානවල දැක්වෙනුයේ ද සංඝ සමාජයෙහි මෙන්ම ගිහි සමාජයෙහි සමාජිකයන්ගේ චර්යාවෙහි ලක්ෂණයන්ය හා ධර්මය පිළිබඳ අවබෝධයෙහි ස්වභාවයයි. නිදසුනක් ලෙස අංගුත්තර නිකායෙහි ආධ්‍යාත්මික වග්ගය, අධාර්මික වග්ගය හා අනාපත්ති වග්ගය දැක්විය හැකිය. ඒවාට අනුව ධර්මය හා විනය නිවැරදිව ප්‍රකාශ කිරීම හෝ නොකිරීමත් ධාර්මික හෝ අධාර්මික ජීවන රටාවත් ශාසන චිරස්ථිතිය විෂයෙහි ඍජු බලපෑමක් කරයි.

**නිගමනය**

ඉහත දැක්වූ තොරතුරු අනුව ඒ අනුව භික්ෂුණී සමාජය පිහිටුවීම ශාසන චිරස්ථිතිය විෂයෙහි බලපෑ බව දැක්වෙන ප්‍රකාශය ත්‍රිපිටකටයේම ඇතුළත් ඒ හා අදාළ සෙසු සඳහන්වලට පරස්පර බව පැහැදිලිය. ඉහත දැක්වූ භික්ෂුණී සමාජය පිහිටුවීම පිළිබඳ විස්තරය පශ්චාත් සංස්කරණ යුගයට අයත්ය. පශ්චාත් සංස්කරන යුගයට අයත් ඇතැම් ත්‍රිපිටක කොටස්වල ශාසන සම්ප්‍රදායට පටහැනි සටහන් ද ඇතුළත්ව තිබෙනු හඳුනාගත හැක. භික්ෂුණී සමාජය පිහිටුවීම පිළිබඳ විස්තරයෙහි දැක්වෙන අෂ්ට ගරු ධර්මවල අන්තර්ගතය හා පංචසතික්ඛස්ඛන්ධකයෙහි දැක්වෙන

බුද්ධානුබුද්ධක ශික්ෂාපද මේ සඳහා නිදසුන්ය. එමෙන් ම මෙයත් ශාසන සම්ප්‍රදායට පටහැනි තොරතුරක් විමට ද ඉඩක් පවතී.

**ආශ්‍රිත මූලාශ්‍රය**

*පාරාජිකාපාළි*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 1. (1959) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය.

*පාචිත්තිපාළි*, 1,11. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 2:1,2. (1981-1995) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය.

*මහාවග්ගපාළි*, 1,11. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 3,4 (1959) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය.

*චුල්ලවග්ගපාළි*, 1,11. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 5(i,ii). (1977-1983) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය.

*දීඝනිකාය*, 1,11,111. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 7,8,9. (1960-1982) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය.

සමන්තපාසාදිකා විනයට්ඨකථා III, (2009). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.